

# මාලි
**ලක්ශාන්ත අතුකෝරල**

සසර එක පියසකින්
චුත කරනු ලැබූ මුත්
ප්‍රතිසන්ධියක් පිණිස
වහා වහා එළඹෙන්න සිත් නොදෙයි
පැරණි ජීවිත ලොබත්*හුරු ලෙයත්*දරු පෙමත්
රැහැන් ගැට යදම් මෙන්
මා වෙළාගෙන හිඳියි

සෙනේ බත් කෑවාද
තවම කුස්සියෙ වහළ තෙමෙනවද
පුතාලා රන්ඩු කර ගන්නවද
හවස ගෙයි බුදු පහන තියනවද

සෙනේ ගල් පෝරණේ නැහී ගෙට ආවාම
ඇලපතේ තෙල් ටිකක් ගාගන්න ඕන වී
වැරදිලා මට කතා කරනවද

ඉඳහිටක අපේ ගෙට ගොඩ වැදී
බලා දුක සැප හරිා සිනා සී
රහසින්ම හිමි තැනට යම් ඇදී

පුතාලා පාර දිග පාසලට යන විටද
සෙනේ රෑ වැඩ ඇරී සයිකලෙන් එන විටද
සොහොන් කොත්*පින්න ගස්*ගොක් කැරලි පිටුපසින්
එබී එබී බලා ඉන්නට තියෙන ආසාව
තව වැවෙයි මට පලා යනු නොදී

සෙනේ මං කොහේ හරි හිඳ බලා ඉන්න වග
ඔයාටත් තේරිලා ඇති නේද ළගක සිට
බයවෙන්න තැතිගන්න කාරි නෑ මගෙ සෙනේ
අදත් මං එදා උන් මාලිමයි

දැන් ඔයා ළගට වී
යළි යළිත් කියන්නට බැරි වුණත්
මේ ඔප්පු කරන්නේ
මළත් නොහරිමියි කී සෙනෙහසයි

මගේ ගම් වැසියනේ
මා ගමෙන් එළවන්න
බලි තොවිල් නොනටන්න
සෙත් පිරිත් නොකියන්න
යම් දාක ඔබත් එන සුසානෙහි සැගවිලා
පින්න කොල කළුවරේ දුරින් නොපෙනී එබී
ටික කලක් නැවතිලා
යන්න මට ඉඩ දෙන්න

# සැනසුම කොතන ද ?
**වෙන්නප්පුවේ ඒ පීටර් ප්‍රනාන්දු**

මිනිසා මෙලොව ඉපදුන එම මොහොතෙ      සිට
මිය යන තෙක් ම වද විඳ දිවි සයුර      පිට
සඟවා නොයෙක් ආසාවන් පපුව      යට
සැනසුම සතුට සොයමින් යයි      ඉදිරියට

කිරිකැටි බිලිඳු යොදවා තම බොලඳ      ගත
සැනසුම සොයයි හැම විට මව් තුරුල      මත
නොලැබුන විටක දී පැහැරී ඔහුගේ      සිත
උනුසුම් කඳුලු කැට හෙලමින් හඬනු      ඇත

පසු කර බිලිඳු විය පැමුනුනු ලදරු      විය
දුව පැන නටනු ඇත ඔසවා සිඟිති      පය
නොලැබුන විටදි අනෙකකු ලඟ තිබෙන      දෙය
ඉකි බිඳ හඬයි පෑරී තම ලපටි      ලය

ලැබ ගෙන තරුන විය දරුවා වැඩෙන      කොට
සැනසුම් සතුට ආසා එයි පපුව      යට
රිසි සේ මුදුන්පත් කෙරුමට නොහැකි      විට
වැලපෙනු කිම ද හෙලමින් උනු කඳුලු      කැට

හැම දෙය නොඅඩු ලෙස ලැබගෙන උයද      හවා
සැප දිවි ගෙවන රජ මහ මැතිඳුන්ට      පවා
සැනසුම සතුට එන රජ මාවතය      දවා
වැලපෙයි සුසුම් කඳු හෙලමින් රැයද      දිවා

පඬිවරු ඇතත් වෙසසව නැත බලය      ඇති
නොලිහෙන ගැටලු තව තව පෙර මඟට      එති
විසඳෙනු නුදුටු බව දැක කලකිරුන      ගති
නැගවිත් කඩයි සැනසුම් තුටු හිනෙහි      පෙති

සැනසුම සතුට රිසි සේ ලැබ ගන්න      කියා
නිලතල බලය දනය ද වැය කරන      නියා
වැඩ කල නමුත් බැහැ ගන්නට සතුට      සොයා
හද තුල සතුට සැනසුම පැන ඉවත      ගියා

සැනසුම් සුවේ නොසිඳෙන උල්පත      ඇත්තේ
සාමය සමාදානය ඇති හද      මත්තේ
මේ හැම දෙයම මා නොමඳව ලැබ      ගත්තේ
තේරුම් ගත් පසුය මනු ලෝ දම      සත්තේ

තම පියා විසින් ලංකාවේ පුවත් පතකට ලියන ලද කවි පෙලක් එවන ලද්දේ

ශිරානි ප්‍රනාන්දු - පර්ත්

# මගේ උස් වූ හඬින්
**අතුල ජයදේව**



නාඩන්න මා සොඳුර
මේ මාසයත් ඔහේ ගියාදෙන්
මග තොටේ යනෙන කල
දන්න හඳුනන දෑස් මග හරිමි
ඔවුනගේ කටවල් ඇරෙන්නේ බොහෝවිට
අපට දරුවන් තාම නැද්දැයි අසන්නය

බොහෝ කලක් පෙරුම් පුරාගෙන
සුදු නෙළුමක් ගෙන මැදියමක
නුඹේ කුසට වරක් ආ ඇත් පැටවා
අප නොසිතූ ලෙස අකීකරු වී
බැමි කඩා බිඳ මහ පෙරළියක් කොට
පිටවී අනේ අතුරුදහන් විය

නොදන්නා අයගෙන් අස අසා
විලංගු සොයන්නට ගොස් අපට මග වැරදිණිය
උසුලනු බැරි තරම්වෙයි තව කලක්
ඇත්තටම
අප ගෙනා පව් අපට බොහෝ බර වැඩිය

හිස් කළගෙඩි පිනෙන් පුරවා
බෝමළුවෙ වත්කොට යාතිකා කර ඇවිත්
නුඹ සිහිනෙනුත් ඉකිගසා හඬන විට
මහ රැයේ අවදියෙන්
මහත් වේදනා විඳ මා බිහි කළාවූ
නුඹෙ අතට උදැසන තුරුළුවන
නුඹගේ ද දයාබර දරුවන්ය
මගේ කවි.

# පහන් වැට



## එන්න ඉතින් ....

විසල් අත් තටු විදා විහිදා
පියාඹා එන්න ගගනත සිසාරා
අවරගිර සඳ ගිලුණු
මහ කන්ද මුදුනතින්

රකුසු නෙත් සර මුදා අතුරා
පාළු ගිනියම් අහස ගුගුරා
ගිනි ලවන රවන හිරු
මුවා කර සාළුවෙන් පියාපත්

සැනසෙන්න මට
සැඟවෙන්න මට
තුරුලුවී මිහිකතට
මොහොතකට වැතිරෙන්න
නවතන්න ගඟේ දිය
දඟකරන සුලං රැලි
උණුහුමෙන් සිහිල් වී
ඔබේ සෙවනැල්ල යට
මොහොතකට එකම එක...

රන්සිරිමල් ප්‍රනාන්දු

# ආසාව හා.......

හඳ වටේ කෙස් ඇති
මිරිකා තෙල් හම
අමාරුවෙන් වාඩිවෙන
තඩි මහත දළ රැවුල්
සද්දන්ත මහත්වරු

මිරිකන්නට ආදරයෙන්
ආසාව ඇති කරන
හිනාවෙන හඬන
පුංචි පුංචි බෝනික්කෝ
ඉන්දවති ගෙනැවිත්

ඉඹින්නට පුසුඹ ඇති
කර මහත
තෙල් බේරෙන
බෝනික්කී කම්බුල්
රතු පාට නිල් පාට
නෙක පාට තොල් සායම්

වසන තැන් ඇරපු
පාට සායම් අතුල්ලා
කොන්ඩයේ හැඩ බලන
ලස්සන සුදු නෝනාවරු

එති, යති, ගැවසෙති
සිනහවෙති, -බායි" කියති
ඒත් ! අල්ලන්නට විඳින්නට
නැත (මට) කිසිත් අවසරයක්
විඳින්නට මනැසින්
විතරක්ය පුළුවන්

"යුනිසෙක්ස් සැලුන්" හි
කරනවෑමියෙක්මි මං

ප්‍රසාදිනී වෙත්තසිංහ
මිල්පාක්

# මංසල
**චන්ද්‍රසිරි මීවනගේ**



සළු පොටින් හිස වසා සෙවන දෙන්නට වගේ
ඉස්කෝලෙ හැර ගෙදර රැගෙන අවු කුටකේ
නියර පිට මඩ ගොහොරු පිරුණ මංපෙත් දිගේ
පැමිණි අත්තම්මා තනිකමට එදවස මගේ

නා කොටයෙ වාඩිලා මා ඇරෙන සීනුවට
උණ පඳුරෙ හෙවණ යට රඳව ගෙන මොහොතකට
දැනුණු කුසගිනි ඉවට කඩල ගොටුවක් අතට
අරන් දී හැඹිලියේ සගවගත් ශත පහට

දුක දැනි කඳුළු විත් දෙතොල් සිඹ ලුණු රසට
මළ දවසෙ සාංකාවෙන් පිරුණු පොඩි හිතට
බැණුම් ඇහුවත් නිතර කෙළි කවට කම්වලට
ළගින් හිටියේ ඇයයි දුවේ මං වගෙ නුඹට

කාලයා ඇවෑමෙන් එදා ඈ සිටි තැනට
අද පැමිණ මහළු වී ඇති සුදුව ඉහ නිකට
වාහනෙන් මාරුවී නුඹ ගෙදර එන ටිකට
මග බලා ඉනු මිසක වෙන යමක් නැත මෙමට

රැකෙෂනු නොහැකිය ගෙදර නිදහසක් හිග කමට
වෙහෙස වෙනවා මිසක මුළු දවස ඉගෙනුමට
දුක දැනෙන්නට ඉඩක් නැති උනත් නුඹෙ සිතට
මං මැරන දවසෙවත් හැඳූම් ඒ විද නෙතට

# චූටි පුතුට ආදරයෙන්

කැදැල්ලේ හොඳ සුව      පිරි
නැලවෙයි තාලෙට      සරි
ටිකිරි සිනා පෙරි      පෙරි
පුතා නිදයි      මොළකැටි

පමා වෙලා ආවත්      ඔබ
කලා අපේ ලොවම      එළිය
කැකුළු සිනාවෙන්      නිතරම
සුවඳ හමයි පුංචි      ගෙපැල

පළඳ කිරුළෙන්      මාපිය
පුරවා හිස්තැන      හැමතැන
කරවා ජීවිත      මනහර
පුතා වියන් මැණිකකි      ඔබ !

ප්‍රසාදිනී වෙත්තසිංහ
මිල්පාක්

# කුමාරියක් ඇවිත් ගියා

උදෑසනක පිපි කුසුමක් සේ සුවඳ දසත      පතුරා
සදාතනිකවූ ආදරයක් ගැන සොඳුරු පැතුම්      පතලා
වලාරොදක සිත පා කරලා මියුරු සිහින      මවලා
කුමාරියක් මෙහෙ ඇවිත් ගියා හදට පවන්      සලලා

රසන්ත